# ගල්ඔය - යාල අතර අලිමංකඩ

## ලාහුගල - කිතුලාන ජාතික වනෝද්‍යානය




**ශ්‍රී ලංකාවේ වත්මන් සාම ක්‍රියාදාමයට පිංසිදුවන්නට දශක දෙකකට අධික කාලයක් තිස්සේ සංචාරකයන්ට ළඟාවීමට මං ඇහිරී තිබූ උතුරු නැගෙනහිර පළාත්වල සෞන්දර්යාත්මක හා ඓතිහාසික වැදගත්කමෙකින් අනූන වූ බොහොමයක් සංචාරක ආකර්ෂණ, සංචාරකයන්ට නිවී සැනසිල්ලේ දැකබලා ගැනීමේ අවස්ථාව දැන් උදාවී තිබේ.**

**යු.පී.එස්.පතිරණ**

කාලයක් තිස්සේ පැවති බියකරු යුද්ධයේ ප්‍රතිඵලයක් වශයෙන් උතුරු නැගෙනහිර පළාත්වල සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් මිනිසුන් පමණක් නොව එම පළාත්වල ගහ කොළ සතා සිව්පාවාද අද නිදහස් එල භුක්ති විඳිති. විශේෂයෙන් උතුරු නැගෙනහිර පළාත් වලට මායිම්ව පවතින ජාතික වනෝද්‍යාන සියල්ලක්ම පාහේ අද සංචාරකයන් කැඳවන ජනප්‍රිය සංචාරක කේන්ද්‍රස්ථානයන් බවට පත්වී තිබේ. ඒ අතර, මොනරාගල සිට සියඹලාණ්ඩුව හරහා පොතුවිල් දක්වා දිවෙන A 4 මාර්ගයේ පිහිටා ඇති ලාහුගල - කිතුලාන ජාතික වනෝද්‍යානයට හිමිවන්නේ වැදගත් ස්ථානයෙකි.

කොළඹ සිට කි.මී.320 පමණ දුරින් පිහිටි ලාහුගල වනෝද්‍යානය වෙත ළඟාවිය හැකි ප්‍රධාන මාර්ග දෙකකි. එක් මඟකින් කොළඹ සිට රත්නපුර, පැල්මඩුල්ල, බලංගොඩ බෙරගල ඔස්සේ වැල්ලවාය දක්වාත්, අනෙක් මඟ පැල්මඩුල්ලෙන් හැරී තණමල්විල තිඹොල්කැටිය උඩවලව ඔස්සේ වැල්ලවාය දක්වාත්, ගොස් එතැන් සිට මොනරාගල සියඹලාණ්ඩුව හරහා පොතුවිල් දක්වාත් දිවෙන මාර්ගයෙන් එහි ළඟාවිය හැකිය.

1980 ඔක්තෝබර් 31 වෙනි දින ජාතික වනෝද්‍යානයක් බවට ප්‍රකාශයට පත්කර ඇති මෙම වනෝද්‍යානය විශාලත්වයෙන් හෙක්ටයාර 1554 ක් පමණ වේ. පැරණි රෝහණ රාජධානියට අයත් මෙම වනෝද්‍යානය මහවැව, කිතුලාන හා සෙංගමුව යන වැව් තුන කේන්ද්‍රකොට පවතී.

මහවැව අද වඩාත් ප්‍රකටව ඇත්තේ ලාහුගල නමිනි. අක්කර 600 ක් පමණ භූමි ප්‍රදේශයක් වසාගත් ලාහුගල වැව අක්කර 2760 ක ජලධාරිතාවකින් යුක්ත වේ. මෙහි වැව්බැම්මේ දිග අඩි 3700 ක් පමණ වේ.

වියළි කලාපයේ පිහිටි මෙම වනෝද්‍යානය ඊසානදිග මෝසම් සුළඟින් වර්ෂාව ලබන වියළි මිශ්‍ර සදහරිත වනාන්තර ගණයට ගැනේ. මෙම වනෝද්‍යානයට මි.මි.1700 ක පමණ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලැබේ.

ප්‍රධාන මාර්ගය හා හැඩඔය අතර පිහිටි මෙම වනාන්තරය ද්විතියික වනාන්තරයක් වුවද, විශාල වෘක්ෂලතාද සහිත ඝන වනාන්තර ස්වරූපයක්ද පෙන්නුම් කරයි.

**වියළි කලාපයේ පිහිටි මෙම වනෝද්‍යානය ඊසානදිග මෝසම් සුළඟින් වර්ෂාව ලබන වියළි මිශ්‍ර සදහරිත වනාන්තර ගණයට ගැනේ. මෙම වනෝද්‍යානයට මි.මි.1700 ක පමණ සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලැබේ**



මෙම වනෝද්‍යානයේ ප්‍රමුඛ ශාක අතර පලු, වීර, බුරුත ඇතුළු වියළි කලාපීය ශාක විශේෂ වැදගත් තැනක් උසුලයි. බෙරු (Oplismenus Compositus) නම් ජලජ තණ විශේෂය වැව් ආශ්‍රිතව බහුලව වැඩී පවතී.

මෙම වනෝද්‍යානය ජෛව විවිධත්වය අතින් ද ඉතා පොහොසත්ය. ලාහුගල, කිතුලාන, වනෝද්‍යානය වෙත පැමිණෙන සංචාරකයන්ට කිසිසේත් වැවෙහි බැස සිටින වල් අලින්ගේ දසුන කිසිසේත් මග නොහැරේ. උදේ කාලයේදීත් සවස් කාලයේදීත් මහාමාර්ගය හරහා යන වල් අලීන් සුලබ දසුනකි. ඒ ගල්ඔය වනෝද්‍යානයේ සිට යාල වනෝද්‍යානය වෙත නිතරම වල් අලීන් එහා මෙහා යන අලිමංකඩ වැටී ඇත්තේද ලාහුගල වනෝද්‍යානය හරහා හෙයිනි. ක්ෂීරපායි සත්ව විශේෂ 20 කට අධික ප්‍රමාණයක් වෙසෙන මෙම වනෝද්‍යානය තුළ දිවියා, වලහා, තිත්මුවා, ගෝනා, කබල්ලෑවා, දියබල්ලා ඇතුළු වියළි කලාපීය වනසත්ව විශේෂ රැසකටද වාසභූමි සලසා තිබේ. මීට අමතරව ආවේණික මත්ස්‍ය විශේෂ හා උරග විශේෂ රැසක් මෙන්ම සමනල විශේෂ කිහිපයක්ද නිරීක්ෂණය කළ හැකියි.

උත්තරාර්ධ ගෝලයේ ශීත ඍතුව ආරම්භවීමත් සමග දකුණට එනම් ශ්‍රී ලංකාව තෙක් ඇදී එන පර්යටන පක්ෂීන් මෙන්ම දියකාවුන් තුඹසේරුන්, කොක්කු ආදී ජලජ පක්ෂීන් ද මෙම වනෝද්‍යානයට අමුත්තන් නොවේ.

ලාහුගල ජාතික වනෝද්‍යානය ආසන්නයේ පිහිටි සෞන්දර්යත්වයෙන් හා පෞරාණිකත්වයෙන් ඉතා වැදගත් තැනක් ගන්නා ස්ථාන කිහිපයක්ද වේ. ඒ අතර, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පසුකර මදක් දුර ගියවිට දකුණට හැරී පැරණි ලාහුගල ගම මැදින් කි.මීටර් භාගයක් පමණ දුරින් රුහුණු මහා විහාරය හෙවත් මගුල් මහා විහාරය හමුවේ.

ක්‍රි.ව.516 සිට 526 දක්වා රජකළ ධාතුසේන රජතුමා විසින් පිහිටුවන ලද රුහුණු මහ වෙහෙර මෙය බවට මෙම ස්ථානයෙන් ලද ටැම් ලිපියක දැක්වේ. කෙසේ වුවද, මෙම විහාරය මගුල් මහා විහාරය ලෙස වඩාත් ප්‍රකට වී ඇත්තේ ඒ හා බැඳුණු ජනාවාස රැසක් ඇති නිසාවෙනි. එනම් රට මුහුදට බිලිවෙන්නට ගිය අවස්ථාවක එම උවදුරෙන් රට බේරාගැනීම සඳහා කැළණි පුරයෙන් මුහුදට බිලි කළ විහාරමහා දේවිය පොතුවිල් මුහුදු තීරයේ මුහුද මහා විහාරය නමින් අද ප්‍රකට ස්ථානයට ගොඩබැසීමෙන් අනතුරුව ඇය කැඳවාගෙන ගොස් කාවන්තිස්ස රජතුමා විසින් සරණපාවා ගත් ස්ථානය මෙම මගුල් විහාරය බව පැවසේ.

ප්‍රධාන දෙරටුවෙන් ඇතුල් වූවිට හමුවන මෙම ඓතිහාසික ස්ථානය හඳුන්වන නාමපුවරුව පසු කළ විගස වම්පසින් දක්නට ලැබෙන සඳකඩ පහන සුවිශේෂී සඳකඩ පහනක් ලෙස සැලකේ. එහි දැක්වෙන ඇත් පෙළෙහි එක් ඇතෙකුගේ පිට පිටුපස හෙන්ඩුවකින් එල්ලීයත මිනිසෙකි. මෙවන් සඳකඩ පහනක් වෙනත් තැනක හමු නොවන බව පැවසේ.

අතීත කාලයේ දී පොතුවිල් ප්‍රදේශයේ බෞද්ධ ජනයා විසූ බව සනාථ කෙරෙන මුහුදු මල් වෙහෙරද තවත් වැදගත් ඓතිහාසික ස්ථානයක් වන අතර බුදුපිළිමයක් මෙන්ම කාවන්තිස්ස රජුගේ හා විහාරමහා දේවියගේ යැයි සැලකියහැකි ප්‍රතිමා දෙකක් ද මෙම ස්ථානයේ දක්නට ලැබේ. මීට අමතරව ලාහුගල වනෝද්‍යානය පසු කළ විට හමුවන පොතුවිල් නගරයත් ආරුගම්බොක්කත් අද සංචාරකයන් ආකර්ෂණය කෙරෙන සංචාරක පාරාදිසයක් බවට පත්වෙමින් පවතී.

කෙසේ වුවද, වත්මන් සාම ක්‍රියාදාමය හේතුවෙන් ලාහුගල වනෝද්‍යානයටත් එතැනින් ආරුගම් වෙරළටත් ඇදී එන දේශීය සංචාරකයන් මෙන්ම ආරුගම් බොක්කේ ධීවර කර්මාන්තය සඳහා පැමිණෙන සංචාරක ධීවරයන් නිසාද මෙම සුන්දර පරිසර පද්ධතියට දැනටමත් තර්ජන එල්ලවී ඇති බවද මෙහිදී සඳහන් නොකරම බැරිය. ❑

